ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	වටිනාකම රු.7,007,580 ක් වූ සතුන් 295 ක් හා වටිනාකම ඉදිරිපත් නොවූ සතුන් 1,416 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ පශු සම්පත් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	මව් සතුන්ට අදාල වන වටිනාකම වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව	පශු සම්පත්, වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ගිණුම්ගත කළ යුතුය.
ii.	ආයතනය සතු සියලුම වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ-6) දැක්විය යුතු වුවත්, ඉඩම් 12 ක් සහ නිලධාරී නිවාස 126 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ගිණුම්ගත කර නොමැති නිල නිවාස 126 හා ඉඩම් 12 ගිණුම්ගත කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන බව	කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර දෙපාර්මේන්තුව සතු මූල්‍ය නොවන වත්කම් සියල්ල ගිණුම්ගත කළ යුතුය.
iii.	වැය ශීර්ෂ යටතේ සිදුවන වැරදි එම වැය ශීර්ෂය තුළින්ම ගැලපීම් කර නිවැරදි කළ යුතු වුවත් රු.264,635 ක් වූ වැරදි නිවැරදි කිරීමට අදාළ ගැලපීම වත්කම් අපහරණය ලෙස ගලපා සාවද්‍ය ලෙස හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශයේ දක්වා තිබුණි.	ඉදිරියේ දී එවැනි විශේෂිත කරුණු සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කරන බව	වැය ශීර්ෂයන්ගේ වැරදි එම වැය ශීර්ෂය මඟින් නිවැරදි කරවා ගත යුතු අතර, සාවද්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශයේ අනාවරණය නොකළ යුතුය.

(ආ) විගණනයට සාක්ෂි නොමැති වීම

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	2018 දෙසැම්බර් 31 දිනැති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමට අදාල මාර්ගෝපදේශයේ 1.1.1, 2.3 ඡේද ප්‍රකාර වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු මඟින් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6) ගිණුම් ගත කළ යුතු වුවත්, ගිණුම්ගත කර ඇති රු.3,259,946,017 ක් වූ මූල්‍ය නොවන වත්කම් සඳහා තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.	පරිපාලන අංශය විසින් ඉඩම්, ගොඩනැගිලි, වාහන, ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ වලට අදාල තොරතුරු සෑම අංශයකින්ම අදාල ආකෘති මඟින් ලබාගෙන ස්ථාවර වත්කම් ලේඛන සැකසූ පසු මුදල් අංශය විසින් CIGAS පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව	අදාළ මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව විධිමත් තක්සේරු සිදු කර මූල්‍ය නොවන වත්කම්වල නිවැරදි තක්සේරු අගය ගිණුම් ගත කළ යුතු අතර, එම තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය.
ii.	එමෙන්ම යථෝක්ත මාර්ගෝපදේශයේ 1.3.1, 2.3, 4.3 වගන්ති ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් සෑම වර්ෂ 05 කට වරක්ම තක්සේරු කළ යුතු වුවත් ඒ අනුව වත්කම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණ බැවින්, වත්කම්වල සාධාරණ අගයක් මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය වී නොතිබුණි.	දෙපාර්තමේන්තුවට අදාළ සියළුම ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බව.	මාර්ගෝපදේශ විධිවිධානයන්ට අනුව කටයුතු කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් රු.1,536,870,000 ක්වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.1,294,262,278 ක් පමණක් උපයෝජනය කර තිබුණු බැවින්, මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.242,607,722 ක් හෙවත් සියයට 15 ක් ඌණ උපයෝජිතව පැවතුණි.	තනතුරු පුරප්පාඩුව පැවතීම මත ඉන්ධන දීමනාව සඳහා වෙන් කළ මුදල් ඉතිරිවීම, මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් පැවැත්වීම ආදිය මඟින් වියදම් අවම කර ගැනීමට කටයුතු කිරීම, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මනා ලෙස නඩත්තු කිරීම මඟින් අලුත්වැඩියා අවශ්‍යතා අවම වීම	ඉදිරි වර්ෂයන් සඳහා විධිමත් පරිදි ඇස්තමේන්තු සැකසීමටත්, වෙන් කළ ප්‍රතිපාදන අරමුණු පාදක කරගෙන පූර්ණ උපයෝජනය කිරීමටත් පියවර ගත යුතුය.

(ආ)	මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී එම ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වැය විෂයයන් 12 ක් සඳහා රු.60,181,000 ක් අධි ඇස්තමේන්තුගත කර තිබූ අතර වැය විෂයයන් 08ක් සඳහා රු.24,388,000ක් ඌණ ඇස්තමේන්තුගත කර පැවතුණි.	ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් ආසන්න අගයකට සකස් කිරීමට වගබලා ගැනීමට කටයුතු කළ ද ඇතැම් සුවිශේෂී වූ හේතූන් මත යම් වෙනස්කම් සිදුවන බව	හැකිතාක් දුරට සම්පූර්ණ හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා වැඩපිළිවෙලක් යෙදිය යුතුය.

2.2 බැරකම් හා බැඳීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ රු.1,482,432 ක් වූ බැරකමක් දෙවතාවක් ගිණුම් ගත වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති බැරකම් ශේෂය එම අගයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණු අතර, වටිනාකම රු.2,590,827 ක් වූ බැරකමක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.	බැරකම් ප්‍රකාශය තුල ඉදිකිරීම් දෙකක් වෙනුවෙන් බැරකම් සටහන් කළ යුතු වුවත් එම බැරකම් දෙකෙහිම වැරදීමකින් එකම අගය සටහන් කර ඇත. එබැවින් රු.1,108,395 ක මුදලක් අඩුවෙන් ගිණුම්ගත වී ඇති බව	වර්ෂය තුළ පවතින සියලුම් බැඳීම් හා බැරකම් නිවැරදිව හඳුනාගෙන වාර්තා වන බව තහවුරු වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දිය යුතුය.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2009 පෙබරවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති මාලාවේ xviii වැනි පරිච්ඡේදයේ 193 වන ඡේදය	සෑම රාජ්‍ය නිලධාරියෙකුම සේවා කාලය අවුරුදු 05 සම්පූර්ණ වූ විට ස්ථාන මාරු වීම් වලට යටත් විය යුතු වුවත් නිලධාරීන් 79 දෙනෙකු හට වසර 06 සිට වසර 21 දක්වා සේවා කාලයක් ස්ථාන මාරු වීම් ලබා දී නොතිබුණි.	පිළිතුර ලබා දී නොමැත	වර්ෂ 5ක සේවා කාලයක් ගතවීමෙන් පසු නිලධාරීන් ස්ථානමාරු කළයුතු අතර, ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	මාණ්ඩලික නිලධාරීන් සඳහා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැකි උපරිම සීමාව රු.100,000 ක් වුවද අවස්ථා 10 කදී නිලධාරීන් 03 කු හට රු.109,775 සිට රු.412,500 ක් දක්වා එකතුව රු.2,405,450 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි.	රු.100,000 වැඩි තත්කාර්ය අතුරු අග්‍රිම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වේ අනුමැතිය මේ වන විට ලබා ගන්නා බව	චක්‍රලේඛයේ සීමාවන් ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා නොදිය යුතු අතර, නීතියට අනුකූල නොවූ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 880 සිට 893	නියමයන් ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් 38 දෙනෙකු රු.377,500 ක් වූ ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුර ලබා දී නොමැත.	නීතිමය විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු සියලුම නිලධාරීන් ඇප තැබීමට පියවර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඇස්තමේන්තුගත එකතු වටිනකාම රු.මි.112.68 ක් වූ ඉදිකිරීම් 68 කින් එකතු වටිනාකම රු.මි.74.22 ක් වූ ඉදිකිරීම් 49 ක් හෙවත් සියයට 72 ක් වර්ෂය තුළ ඉටු කර නොතිබුණි.	ඉංජිනේරුවරයෙක් මෙන්ම තාක්ෂණික කාර්යය මණ්ඩල ධාරිතාවයේ විශාල අඩුපාඩු පැවති බැවින් 2024 වර්ෂයේ සැලසුම් කර තිබූ ඉදිකිරීම් හා අලුත්වැඩියාවලින් කොටසක් පමණක් සිදු කිරීමට සිදු වූ බව	සැලසුම්ගත කාර්යය ඉටු කිරීමට කටයුතු නොකළ නිලධාරීන් පිළිබඳව විධිමත් පරිදි ක්‍රියා කිරීමටත් ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය
(ආ)	රටතුළ පවතින බිත්තර, මස්, කිරි නිෂ්පාදනයන්හි ගුණාත්මක භාවය පිරිහීමට සත්ත්ව ආහාරවල බලපෑමක් පැවතීම සම්බන්ධයෙන් පරීක්ෂාවට අදාළ තොරතුරු හා නිසි සහයෝගය විගණනයට ලබා නොදීම, විගණන විෂය පථය සීමා කිරීම හේතුවෙන් 1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනතේ 6(ආ) 10(ii) වගන්තියේ විධිවිධාන ප්‍රකාර සත්ත්ව ආහාරවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන්	පිළිතුර ලබා දී නොමැත	විගණනයට අවශ්‍ය තොරතුරු හා සහයෝගය ලබා නොදී විගණන විෂය පථය සීමා කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගැනීමටත් විගණනයට අවශ්‍ය තොරතුරු හා සහාය ලබා දීමටත් කටයුතු කළ යුතුය.

රෙජිස්ටාර්වරයාගේ නිසි වගකීම ඉටුකළේ ද යන්න විගණනයට සනාථ කරගත නොහැකි විය.

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුණ්ඩසාලේ මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය		
i.	දේශීය කුකුලන් වැඩිදියුණු කර ප්‍රවර්ධනය, පර්යේෂණ කටයුතු සිදු කිරීම යන අරමුණින් මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වූ නමුත් මෙහි කුකුල් පර්යේෂණ කටයුතු සිදු කිරීම 2018 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. එමෙන්ම උපරිම ධාරිතාවය 5,420 ක් වූ කුකුල් කූඩුවල කුකුලන් ඇති කිරීම 1976 ක් ලෙස සියයට 36 කින් අඩු වී පැවතුණි.	මෙම මධ්‍යස්ථානයේ අරමුණ ක්ෂේත්‍රයේ පවතින දේශීය ජාන සංරක්ෂණය බවත් කුකුළු පැටවුන්ගේ ඉල්ලුම අනුව බිත්තර රක්කවීම සඳහා කුකුලන් ගොවිපලෙහි ඇති කරනු ලබන බව	මූලික අරමුණු ඉටු කිරීම සඳහා ක්‍රියා මාර්ග නොගැනීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කිරීමටත්, ව්‍යාපෘතිය අරමුණු කරා ගෙන යාමට වැඩපිළිවෙලක් සකස් කිරීමත් කළ යුතුය.
ii.	කුකුල් නිවාසවල සම්මත ප්‍රමාණයට වැඩියෙන් කුකුලන් 130 ක් රඳවාගෙන තිබීම හේතුවෙන් වර්ෂය තුළ රු.1,350,364 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.	තාක්ෂණිකව අවශ්‍ය කුකුලන් ප්‍රමාණය වන ගණන පමණක් ගොවිපල තුල තබාගෙන ගොවිපළක් පවත්වා ගෙන යා නොහැකි අතර ඒ සඳහා ලිංග නිර්ණ නිරවද්‍ය ප්‍රතිශතය, මරණ අනුපාතය, අභිජනන කාර්යක්ෂමව හා වෙනත් තාක්ෂණික කරුණු සලකා බලනු ලබන බව	රජයේ මුදල් අනවශ්‍ය අයුරින් වැය නොකර ආර්ථිකභාවයෙන් යුතුව කටයුතු කිරීමට පියවර ගත යුතුය.
iii.	ආර්ථික වටිනාකම් කාලය අවසන් වී ඇති සතුන් 753 ක් අපහරණයට අදාළව කළමනාකරණ තීරණ ගැනීමේ දුර්වලතාවය නිසාවෙන් සතුන් අපහරණය නොකිරීම තුළ 2025 මාර්තු 07 දින වන විට කුකුල් කෑම සඳහා පමණක් රු.1,334,814 ක අනවශ්‍ය පිරිවැයක් දරා තිබුණි.	සතුන් 484 ඉවත් කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත්කර එහි නිර්දේශ අනුව මේ වන විට මිල ගණන් කැඳවා ඇති බවත් එම සතුන් ද කඩිනමින් ඉවත් කරන බව	අපහරණ කටයුතු කාලීනව සිදු නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් කිරීමත්, ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට වැඩ පිළිවෙලක් යෙදීමත් කළ යුතුය.

(ආ) i.	ඉඹුලන්දණ්ඩ පශු පර්යේෂණ ආයතනය ඉදිරි වර්ෂ 05 ක් තුළ එළුවන් 250 ක් ක්ෂේත්‍රගත කිරීම, වාණිජ ගොවිපලවල් ඇති කිරීම, බෝයර් වර්ගයේ එළු ශුක්‍රානු නිපදවීම යන අරමුණු වෙනුවෙන් 2019 වර්ෂයේදි රු.37,341,430 ක් වැය දරා සෞඛ්‍ය නිර්ණායක හා ලෝක සෞඛ්‍ය සංවිධාන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව බෝයර් වර්ගයේ එළුවන් 100 ක් ආනයනය කර තිබුණි.	පිළිතුර ලබා දී නොමැත	විධිමත් පරීක්ෂණයක් පවත්වා අනුකූලතාවය නොදැක්වූ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.
ii.	2024 දෙසැම්බර් 31 දිනට මධ්‍යස්ථානයේ රෝගී තත්ත්වයේ එළුවන් 141 ක් පමණක් ශේෂ වී පැවතුණු අතර ව්‍යාපෘතියේ අරමුණු මුළුමනින්ම ඉටු නොවී පැවතුණි.	පිළිතුරු ලබා දී නැත	රෝගී සතුන් ඉවත් කිරීමටත්, ව්‍යාපෘති අරමුණු ඉටු නොවීමත් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.
iii.	රෝගී එළුවන් (CEA රෝගී) අපහරණයට ගෙන තිබූ තීරණය වර්ෂයක අධික කාලයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට එම රෝගී එළුවන් නඩත්තුව සඳහා රු.75,336,944 ක් ද ඔවුන්ගේ ආනයනික වැය ද ඇතුළුව එකතුව රු.112,678,374 ක් වූ වියදම් රජයට නිෂ්කාර්යය වියදම් වී තිබුණි.	මෙම එළුවන් නිරෝධායන කාල සීමාවේ සිටම CAE රෝගයට ගොදුරුවීම හේතුවෙන් අරමුණු ඉටු කර ගැනිමට නොහැකි වී ඇති බව.	- එම -
(ඇ)	**තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය**		
i.	2000 වර්ෂයේදී ජමුනාපාරී එළුවන් ව්‍යාප්ත කිරීම වෙනුවෙන් තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණු නමුත් ඉකුත් වර්ෂ 05 තුළ අදාළ ව්‍යාපෘතියේ අරමුණ වූ එළුවන් ප්‍රජාව වෙත ලබා දීම එළුවන් 213 සිට 31 ක් ලෙස ශීඝ්‍රයෙන් පහත වැටී තිබුණි.	2020-2022 කාලයේදී පැවති කොවිඩ් වසංගත තත්ත්වය, ඉන්ධන අර්බුධය සහ ආර්ථික අර්බුධය මේ සඳහා හේතු වූ බව	විධිමත් පරීක්ෂණයක් පවත්වා ව්‍යාපෘතියේ අරමුණු ඉටු කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමත්, ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට නව වැඩ පිළිවෙලක් හඳුන්වා දීමත් කළ යුතුය.

ii.	මධ්‍යස්ථානයේ සතුන් Blue Tounge රෝගයෙන් පෙළෙන වාහකයින් බව හඳුනාගැනීමට කටයුතු නොකර එම රෝග වාහක එළුවන් නඩත්තු කිරීම වෙනුවෙන් 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.34,331,552 ක් නිශ්කාර්යව වැය කර තිබුණි.	BT ප්‍රතිදේහ සහිත සතෙකුට එම රෝගය තවත් සතෙකුට බෝකිරිමට හැකියාවක් නොපවතින බවත් එබැවින් මෙම සතුන් නඩත්තුව සඳහා දරණ ලද පිරිවැය නිෂ්කාර්ය පිරිවැයක් ලෙස අර්ථ දැක්විය නොහැකි බව	රජයේ මුදල් ආර්ථිකභාවයෙන් යුතුව උපයෝජනයට විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.
(ඇ)	පොළොන්නරුව කෘතිම සිංචන මධ්‍යස්ථානය		
i.	වියළි කාලයට අදාළව දෙමුහුන් ගව වර්ග වල ශුක්‍ර නිෂ්පාදනය හා දෛනික කෘතිම සිංචන පුහුණු කිරීමේ අරමුණින් අක්කර 100 ක වපසරියක සිටින ගවයින් 48 ක් අතරින් සතුන් 39 ක් රෝගී වීම හේතුවෙන් වර්ෂ 02 කට අධික කාලයක් මධ්‍යස්ථානය පූර්ණ වශයෙන් අක්‍රිය වී පැවතුණි.	ව්‍යාප්ත වූ රෝග තත්ත්වය පාලනය කිරීමට අපහසු වීමත් වියදම් පාලනය කිරීමත් අරමුණු කොට එම කාර්යය සම්පූර්ණයෙන්ම කුණ්ඩසාලේ මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වෙතින් පමණක් සිදු කරන බව	කාලීනව තීරණ නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමටත් මධ්‍යස්ථානය ක්‍රියාකාරීව පවත්වා ගැනීමට නව වැඩපිළිවෙලක් හඳුන්වා දීමටත් කටයුතු කළ යුතුය.
ii.	රෝගී සතුන් අපහරණය සඳහා කඩිනම් මැදිහත් වීමක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සිදු නොකිරීම නිසාවෙන් වටිනාකම රු.3,067,797 ක් වූ ගව ශුක්‍ර වඩි 55,270ක නිෂ්පාදනයක් වර්ෂයකට අධික කාලයක සිට භාවිතා කර නොතිබුණි.	කුණ්ඩසාලේ මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වෙතින් පමණක් ගව ශුක්‍ර එකතු කිරීම, නිපදවීම හා බෙදා හැරීම යන කාර්යයන් සිදු කරන බව	- එම -
iii.	පූර්ණ වශයෙන් අකර්මණ්‍යය වී තිබූ මධ්‍යස්ථානය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.9,449,053 ක වියදමක් දරා තිබූ අතර එය රජයට නිෂ්කාර්යය වැය බරක් වී තිබුණි.	ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා රජයේ කෘත්‍රිම සිංචන ශිල්පීන් පුහුණු කරන එකම ආයතනය පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වන බව	- එම -

3.3 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෘතිම සිංචන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම ව්‍යාපෘතිය - 2023 මඟින් රසායනාගාර උපකරණ මිලදී ගැනීම සඳහා රු.24,000,000ක් වූ වියදම් ඇස්තමේන්තු කර තිබුණු ඒ සඳහා රු.72,346,750 ක් වැය කර තිබූ බැවින් ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව කටයුතු කර ඇති බවත් අවශ්‍යතාවය හඳුනාගෙන නිවැරදිව සැලසුම් පිළියෙල කර නොමැති බවත් නිරීක්ෂණය විය.	සතුන් ආනයනය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා කටයුතු කළ ද ලංසුකරුවෙකු ඉදිරිපත් නොවූ බවත්. සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම හරහා රසායනාගාර උපකරණ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.	ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව සකස් නොකිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන 04 ක රජය සතු වත්කම් 06 ක අයිතම් 28 ක් වර්ෂයට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යය කර තිබුණි.	ගාල් අලුත්වැඩියාව සඳහා මුදල් ප්‍රතිපාදන මේ වනවිට ඉල්ලුම්කර ඇති බව, ගොවිපල භූමිය එලදායීව පවත්වාගෙන යාමට කටයුතු කරන බව, නිල නිවාස වල පදිංචිය සඳහා අවශ්‍යතාවයක් ඇති වී නොමැති බව, අපේක්ෂිත මට්ටමේ සතුන් ප්‍රමාණයක් ගොවිපල සතු නොවීම, යතුරුපැදිය දැනට භාවිතා කිරීමට නිලධාරින් නොමැති වීම, සයිලේජ් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය නොවන බව, Semen Collection Yard කොටස කෘත්‍රිම සිංචන පුහුණු කටයුතු වල දී භාවිතයට ගන්න බව, ආපනශාලාව ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව පූර්ණ කාලීනව දේශන ශාලාවක් වශයෙන් භාවිතා කිරීමට අපේක්ෂිත බව	වත්කම් නිෂ්කාර්ය නොවන පරිදි උපයෝජනය කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

3.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයේ මුදල් නිලධාරිනිය (සරප්) විසින් සිදු කර තිබූ රු.14,749,160 ක මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව මු.රෙ.104(4) පූර්ණ පරීක්ෂණ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිකුත් කර නොතිබුණි.	පිළිතුරු ලැබී නොමැත	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල වාර්තා කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව ඍජුව වගකීමට බැඳෙන මුදල් නිලධාරිනියට (සරප්) එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද මෙම අක්‍රමිකතාවයට වගකීමට බැඳෙන අනෙකුත් පාර්ශවයන් වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	පිළිතුරු ලැබී නොමැත	විධිමත් පරීක්ෂණ පවත්වා අක්‍රමිකතාවයන්ට සම්බන්ධ අනෙකුත් නිළධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගතයුතු වීම

3.6 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මු.රෙ. 104 ප්‍රකාරව රජයට සිදු වූ හානි/පාඩුව නිශ්චිතව හඳුනාගෙන අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වුවත් වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක් ගත වී තිබූ අවස්ථා 392 කට අදාළ හානි හා පාඩු එකතු වටිනාකම රු.32,033,833 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හානි පාඩු සම්බන්ධයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ විධිමත් ක්‍රියාමාර්ග ගැනීමටත්, හානි හා පාඩු කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	මු.රෙ.104(4) ප්‍රකාරව හානි පාඩු සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තා සකස් කළ යුතු වුවත් වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක් ගත වී තිබූ එකතු වටිනාකම රු.6,711,879 ක් වූ හානි පාඩු සිද්ධීන් වාර්තා 289 ක් පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි**.**	හානි පාඩු සම්බන්ධයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	පරීක්ෂණ නිම නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමටත් හානි පාඩු සම්බන්ධයෙන් පරීක්ෂණ කඩිනමින් පැවැත්වීමටත් පියවර ගත යුතුය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(ඇ)	එකතු වටිනාකම රු.255,534 ක් වූ සතුන් 30 ක් මියගොස් වර්ෂ 1 ත් 2 ත් අතර කාලයක් ගත වී තිබූ නමුත් අදාළ මරණ පරීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි	හානි පාඩු සම්බන්ධයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනිමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	අදාල වාර්තා ඉදිරිපත් නොකිරීම සම්බන්ධව විධිමත් පරීක්ෂනයක් කිරීමටත් හානි පාඩු සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණ පැවැත්වීමටත් පියවර ගත යුතුය.

3.7 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව 2020 අගෝස්තු 01 දින කුර හා මුඛ රෝග එන්නත් 100,000 ක් ඒකක මිල රු.82 බැගින් මිලදී ගැනීම නිසාවෙන් රජයට සිදු වූ පාඩුව රු.මි.3.9 ක් විය. මේ සම්බන්ධයෙන් ගිණුම් කාරක සභා නිර්දේශ ප්‍රකාර විමර්ශනයක් සිදු කර තිබුණද ඒ සඳහා ආයතනයෙන් බැහැර කිසිදු රාජ්‍ය නිලධාරියෙකු සහභාගී කර නොතිබුණි. විමර්ෂණ වාර්තාව මඟින් කිසිදු අලාභයන් සිදු වී නොමැති බව තීරණය කර තිබුණ ද මේ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සුදුසු මැදිහත් වීමක් දක්නට නොතිබුණි.	මෙම පරීක්ෂණ මණ්ඩලයේ බාහිර සාමාජිකයෙකු ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයේ පරිපාලන නිලධාරි පත් කර ඇති අතර පරීක්ෂණ වාර්තාවේ පිටපතක් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බව.	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ මැදිහත්වීමෙන් ස්වාධීන පරීක්ෂන මණ්ඩලයක් මඟින් ගිණුම් කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතු වීම.

3.8 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරය සඳහා Automatic 20 L & 200 L Bioreactor යන්ත්‍රයක් 2022 ජූලි 29 දින මිලදී ගෙන තිබූ අතර ඒ වෙනුවෙන් රු.96,548,000 ක් වැය දරා තිබුණි. රටේ පවතින සාමාන්‍ය එන්නත් අවශ්‍යතාවය වූ 300,000 ක එන්නත් වඩි ප්‍රමාණය සපුරා ගැනීම වෙනුවෙන් රු.මි.96 ක් වැයකර වාර්ෂික එන්නත් වඩි 500,000 සිට 1,200,000 ක ධාරිතාවයක් සහිත නව යන්ත්‍රයක් මිලදීගෙන තිබූ අතර එමඟින් සාමාන්‍ය එන්නත් වඩි අවශ්‍යතාවය වූ 300,000 ක	නව උපකරණය මඟින් වාර්ෂිකව එන්නත් වඩි ලක්ෂ 12 ක් නිපදවිය නොහැකි අතර එහි උපරිම ධාරිතාවය වඩි ලක්ෂ 5 ක උපරිමයකි. එන්නත් වඩි ලක්ෂ 12 ක ප්‍රමාණය නිපදවීම වසර 5 කට සැලසුම් කර ඇති බව.	මෙම අනාර්ථික තීරණ ගැනීමට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධ විධිමත් පියවර ගැනීමටත් රජයේ මුදල් වැය කිරීමේදී එම දරන ලද මුදල් වලින් උපරිම ඵලදායීතාවය ලබා ගත හැකි වැඩ පිළිවෙලක් හඳුන්වා දීමටත් කටයුතු කළ යුතුය.

ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම තුල රජයට අනවශ්‍ය වැය බරක් දැරීමට සිදුවී තිබුණු අතර, අදාළ යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි.

4. යහපාලනය

4.1 මහජනයා වෙත සේවය ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ගන්නෝරුව මධ්‍යම පශු විමර්ශන මධ්‍යස්ථානයේ රසායනාගාර පරීක්ෂණ කටයුතු වලදී මත්ස්‍ය විෂයයට අදාළව මත්ස්‍ය රෝග පරීක්ෂා කර වාර්තා ලබා දෙනු ලබන අතර මත්ස්‍ය වගාකරුවන් මත්ස්‍ය ආනයන, අපනයන කටයුතු වෙනුවෙන් ලියාපදිංචි කිරීම් සිදු කරනු ලබයි. ඒ අනුව මත්ස්‍ය අපනයනයට අදාළ මත්ස්‍ය තොග පරීක්ෂා කර බලා අනුමැතිය ලබාදීම සිදු නොකරන අතර, ගොවිපල මාස 06 කට වතාවක් පරීක්ෂා කර සහතික කිරීම සිදු කරයි. ඒ අනුව, ආයතනය නිකුත් කරනු ලබන සහතිකය හා ඊට අදාළ මත්ස්‍ය තොගය අතර ගුණාත්මකභාවයේ විෂමතාවයක් පැවතිය හැකි බව නිරීක්ෂණය විය.	ඉදිරියේ දී ඒ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය සහ රසායනාගාර පහසුකම් ලද හොත් මෙම ආකාරයට එක් එක් අපනයනට අදාළ මත්ස්‍ය තොග පරීක්ෂා කිරීම සඳහා යොමු විය හැකි බව	මෙහෙයුම් කටයුතු වල කාර්ය සාධනය ඵලදායීව සිදු කිරීමට විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වා දිය යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී පුරප්පාඩු 216 ක් පැවතුණු අතර තනතුරු 02 ක අතිරික්ත සේවක ප්‍රමාණය 23 ක් වේ.	පිළිතුර පසුව ලබා දීමට කටයුතු කරන බව.	කාර්ය මණ්ඩලය සමාලෝචනය කර අවශ්‍ය පුරප්පාඩු තනතුරු පිරවීමටත්, අතිරික්ත කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් කිරීමටත් පියවර ගත යුතුය.